**උතුරු මැද පළාත් සභාව - 2019**

1. මූල්‍ය ප්‍රකාශන

------------------

1.1 තත්ත්වාගණනය කළ මතය

--------------------------------

උතුරු මැද පළාත් සභාවේ 2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය, මුදල් ප්‍රවාහ ප්‍රකාශය, වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1987 අංක 42 දරන පළාත් සභා පනතේ 23(1) වගන්තිය හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (3) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පළාත් සභා පනතේ 23(2) වගන්තිය හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) උපවගන්තියේ විධිවිධාන ප්‍රකාර සම්පිණ්ඩන වාර්තාව සහ 11(2) උප වගන්තිය ප්‍රකාර විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2020 සැප්තැම්බර් 04 දින නිකුත් කරන ලදී. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව හා ජාතික විගණන පනතේ 10(1) උප වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර මූල්‍ය ප්‍රකාශනවලින් 2019 දෙසැම්බර් 31 දිනට උතුරු මැද පළාත් සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

---------------------------------------------

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විසින් විගණනය සිදු කරන ලදී. මෙම මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

---

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති වියහැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

පළාත් සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම පළාත් භාණ්ඩාගාරය ඇතුළු ඒ ඒ ආයතනවල කළමනාකාරීත්වය විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උපවගන්තිය ප්‍රකාරව උතුරු මැද පළාත් සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

---

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත් ශ්‍රී ලංකා විගණන ප්‍රමිත ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන්ගෙන් තොර බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ආර්ථික තීරණ ගැනීමේදී ඒ පිළිබඳව සැලකිලිමත් විය යුතුය.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නා වූ අවදානම් මඟහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබාගැනීම මාගේ මතයට පදනම වේ. ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදු වන්නා වූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන

සැකසීම, චේතනාන්විත මගහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මගහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස පළාත් සභාවේ අභ්‍යන්තර පාලනය සැලකිල්ලට ගන්නා නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල සහ ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල යෝග්‍යතාවය ඇගයීම.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ඉදිරිපත් කිරීම, ව්‍යුහය සහ අන්තර්ගතය ඇගයීමට ලක් කළ අතර ඒ සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගයීම.

  මාගේ විගණනය තුලදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව කළමනාකරණය දැනුවත් කරන ලදී.

## 1.5 වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව

---

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(ඇ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බව.

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබූ බව.

1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

---------------------------------------

ගිණුම්කරණ අඩුපාඩු

-----------------------

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම් ප්‍රමිත 1 හි 28 ඡේදය අනුව, මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම් ප්‍රමිතවල සියළු අවශ්‍යතා සමඟ අනුකූලවන්නේනම් මිස මූල්‍ය ප්‍රකාශනවල ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම් ප්‍රමිත සමඟ අනුකූලවන්නේ යැයි නොදැක්විය යුතුය. එහෙත් සමාලෝචිත මූල්‍ය ප්‍රකාශනවල ගිණුම්කරණ ප්‍රතිපත්ති හා හෙළිදරව් කිරීම් යටතේ, 1 ඡේදය මඟින් කර ඇති හෙළිදරව් කිරීම අනුව උක්ත අවශ්‍යතාවයට අනුකූලවී නොතිබුණි. | මූල්‍ය ප්‍රකාශනවල ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම් ප්‍රමිත සමඟ අනුකූලවන්නේයැයි දක්වන්නේ නම් මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම් ප්‍රමිතවල සියළු අවශ්‍යතා සමඟ අනුකූලවිය යුතුය. | අදහස් දක්වා නැත. |
| (ආ) | 2015 වර්ෂයේ දී එතෙක් පළාත් සභාවේ එක් එක් අමාත්‍යාංශ/ දෙපාර්තමේන්තුවල ජංගම නොවන වත්කම් සංචලනය පිළිබඳ වාර්තාවල වූ ශේෂයන් සහ ඊට පසු වර්ෂවල දේපල, පිරියත හා උපකරණ අත්පත් කර ගැනීම සඳහා දරන ලද වියදම්, දේපල, පිරියත, උපකරණ ගැලපුම් ගිණුමට මාරු කර නිත්‍ය වශයෙන්ම වත්කම් ලෙස හඳුනා ගන්නා වත්කම් දේපල, පිරියත හා උපකරණ ගිණුමට මාරු කිරීමේ | | |

ක්‍රමවේදයක පළාත් සභාව නිරත වී තිබුණි. ඒ අනුව, 2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශනවල දක්වා ඇති දේපල, පිරියත හා උපකරණ ශේෂය සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | | |
|---|---|---|
| (i) 2019 දෙසැම්බර් 31 දිනට, දේපල පිරියත හා උපකරණ ලෙස නිශ්චිතව හඳුනා නොගෙන දේපල, පිරියත, උපකරණ ගැලපුම් ගිණුමේ රඳවා ඇති ශේෂය රු. 3,920,198,951 ක් විය. | ගැලපුම් ගිණුමේ රඳවා ඇති වත්කම් ශේෂයන් ඉතා කඩිනමින් හඳුනාගෙන අදාල වත්කම් ගිණුම්වලට මාරු කලයුතුය. | වත්කම් කළමනාකරණ පද්ධතිය මගින් වත්කම් නිශ්චිතව හඳුනා ගන්නා තෙක් ගැලපුම් ගිණුමේ රඳවා ගන්නා බව දන්වමි. |
| (ii) දේපල,පිරියත, උපකරණ ගැලපුම් ගිණුමට මාරු කරන ලද වටිනාකමට වඩා වැඩි වත්කම් වටිනාකමක් එම ගිණුම හරහා වත්කම් කළමනාකරණ පද්ධතියට මාරු කිරීම හේතුවෙන් දේපල, පිරියත, උපකරණ ගැලපුම් ගිණුමේ වාහන සහ ඉඩම් හා ඉඩම් වැඩිදියුණු කිරීමේ ගිණුම්වලට අදාලව රු.1,059,640,472 ක එකතු ඍණ ශේෂයක් ඇති වී තිබුණි. එකී ඍණ ශේෂයන් 2019 දෙසැම්බර් 31 දිනට දේපල, පිරියත, උපකරණ ගැලපුම් ගිණුමේ වූ ධන ශේෂයන්ගෙන් හිලව් වී තිබීම හේතුවෙන් 2019 දෙසැම්බර් 31 දිනට එහි ශේෂය එම වටිනාකමින්ම ඌන ගණනය වී තිබුණි. | දේපල, පිරියත, උපකරණ ගැලපුම් ගිණුමේ ඍණ ශේෂය පළාත් සභා අරමුදලේ ශේෂයට ගැලපීම්කර දැක්විය යුතුය. | අදහස් දක්වා නැත. |

| | | |
|---|---|---|
| (iii) දේපල, පිරියත, උපකරණ ගැලපුම් ගිණුමේ සෘණ ශේෂයක් නිරූපනය කරන වත්කම් ගිණුමකට අදාලව ඉකුත් කාල පරිච්ඡේදයක දී අත්හැරුණු වත්කමක් පසුව භෞතිකව හඳුනා ගෙන එය එකී ගැලපුම් ගිණුම හරහා ගිණුම් ගත කිරීමේ දී එහි සෘණ ශේෂය වර්ධනය වීමක් නිතැතින්ම සිදුවේ. එය තහවුරු කරමින්, 2019 ජනවාරි 01 දිනට දේපල, පිරියත, උපකරණ ගැලපුම් ගිණුමේ ශේෂය තුළ ඇතුලත් ඉඩම් හා ඉඩම් වැඩිදියුණු කිරීමේ ගිණුම් ශේෂය රු.1,022,900,000 ක සෘණ අගයක් වුවද වර්ෂය තුළ දී හඳුනාගත් රු.10,146,001 ක වත්කම් ගිණුම්ගත කිරීමේදී එහි වර්ෂ අවසාන ශේෂය රු.1,033,046,000 ක් වී ඇත. තවද, එහි වෙනත් කිසිදු ගනුදෙනුවක් වර්ෂය තුල සිදුව නොතිබුණි. | ඉඩම් හා ඉඩම් වැඩිදියුණු කිරීමේ ගිණුමේ සෘණ ශේෂය පළාත් සභා අරමුදලේ ශේෂයට ගැලපීම්කර දැක්විය යුතුය. | අදහස් දක්වා නැත. |
| (iv) ඉහත (ii) හා (iii) හී සඳහන් දෝෂ 2019 දෙසැම්බර් 31 දිනට දේපල, පිරියත, උපකරණ ගැලපුම් ගිණුමේ ශේෂය වූ රු.3,920,198,951 ට ගැලපූ විට එදිනට එම ගිණුමේ නිවැරදි ශේෂය රු.4,989,985,424 ක් වීම හේතුවෙන් එහි සමස්ථ ඌන ගණනය රු.1,069,786,473 ක් වේ. | දේපල, පිරියත, උපකරණ ගැලපුම් ගිණුමේ සෘණ ශේෂය පළාත් සභා අරමුදලේ ශේෂයට ගැලපීම්කර දැක්විය යුතුය. | අදහස් දක්වා නැත. |

| | | | |
|---|---|---|---|
| | (v) ඉහත (i) හි සඳහන් ශේෂය තුළ ඇතුලත් වාහන, යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ, ගොඩනැඟිලි හා ඉදිකිරීම් සහ වෙනත් මූලධන වත්කම් අත්පත් කර ගැනීමේ හෝ වැඩිදියුණු කිරීම් වලට අදාල සමාලෝචිත වර්ෂයේ වියදම රු.1,722,946,450 ක් වූ නමුත් ඉන් රු.1,559,526,693 ක් නියත වශයෙන්ම ප්‍රාග්ධනිත කළ යුතුද නැද්ද යන්න හඳුනා ගැනීමට නොහැකි වීම විගණනයේ දී ප්‍රශ්ණගත විය. | සමාලෝචිත වර්ෂයේ රු.1,722,946,450 ක් වූ මූලධන වියදම සම්පූර්ණයෙන්ම ප්‍රාග්ධනිත කළ යුතුය. | ගැලපුම් ගිණුමට මාරුකර ඇති වර්ෂයේ වියදමින් නිශ්චිතව වත්කම් ලෙස හඳුනාගත් වියදම් පමණක් වත්කම් ගිණුම්වලට මාරුකරන බව දන්වමි. |
| | ඉහත ඌනතාවයන් හේතුවෙන් 2019 දෙසැම්බර් 31 දිනට වූ දේපල, පිරියත හා උපකරණ ශේෂය නිවැරදිව මූල්‍ය ප්‍රකාශනවලින් නිරූපණය වී ඇති බව විගණනයේදී තහවුරු කර ගැනීමට නොහැකි විය. | දේපල, පිරියත හා උපකරණ ශේෂය නිවැරදිව මූල්‍ය ප්‍රකාශනවලින් නිරූපණය විය යුතුය. | අදහස් දක්වා නැත. |
| (ඇ) | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 02 අනුව ආයෝජනයක්, මුදල් සහ මුදල් හා සමාන දෑ ලෙස සලකනුයේ එය මාස 03 ක හෝ ඊට අඩු කල්පිරීමේ කාලයක් පවතින්නේ නම් පමණක් වුවද සමාලෝචිත වර්ෂයේ මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශයේ මුදල් සහ මුදල් හා සමාන දෑ ලෙස දක්වා තිබුණු රු.2,090,590,117 ක වටිනාකම තුළ 2011 වර්ෂයේ සිට පැවත එන කල්පිරීමේ කාලය මාස 06 ක් වූ වටිනාකම රු.589,857,267 ක ස්වයං අළුත් කිරීමේ (Auto Renewal) පදනම යටතේ | කල්පිරීමේ කාලය මාස 06 ක් වූ වටිනාකම රු.589,857,267 ක ස්ථාරව තැන්පතු මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශයේ ආයෝජන ලෙස දැක්විය යුතුය. | අදහස් දක්වා නැත. |

| | | | |
|---|---|---|---|
| | පවත්වාගෙන යන ස්ථාවර තැන්පතු ද ඇතුලත්ව තිබුණි. එම හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල දක්වා ඇති මුදල් සහ මුදල් හා සමාන දෑ ශේෂය සහ ආයෝජන ශේෂය එම වටිනාකමින්ම පිළිවෙලින් අධි හා ඌන ගණනය වී තිබුණි. | | |
| (ඇ) | මූල්‍ය ප්‍රකාශනවල අස්පෘශ්‍ය වත්කම් ලෙස දක්වා තිබුණු රු.66,956,946 ක ශේෂය තුල රු.56,462,237 ක් වටිනා සූර්ය බල පද්ධති, වායු සමීකරණ පද්ධති, විදුලි බල පද්ධති, යනාදී ස්පෘශ්‍ය වත්කම් ඇතුලත්ව තිබීම හේතුවෙන් 2019 දෙසැම්බර් 31 දිනට වූ අස්පෘශ්‍ය වත්කම් ශේෂය සහ දේපල පිරියත හා උපකරණ ශේෂය පිළිවෙලින් රු.56,462,237 කින් අධි හා ඌන ගණනය වී තිබුණි. | සූර්ය බල පද්ධති, වායු සමීකරණ පද්ධති, විදුලි බල පද්ධති, යනාදී වත්කම් දේපල, පිරියත හා උපකරණ යටතේ දැක්විය යුතුය. | අදහස් දක්වා නැත. |
| (ඉ) | මූල්‍ය ප්‍රකාශනවලට අනුව 2019 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු ආයෝජන පොලී ආදායම රු.59,800,313 ක් වුවද එදිනට ස්ථාවර තැන්පතු සහතික අනුව ලැබිය යුතු පොලී ආදායම රු.29,791,905 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රකාශනවල වැඩියෙන් දක්වා තිබුණු ලැබිය යුතු ආයෝජන පොලී ආදායම රු.30,008,408 ක් විය. | ලැබිය යුතු ආයෝජන පොලී ආදායම නිවැරදිව මූල්‍ය ප්‍රකාශනවල දැක්විය යුතුය. | අදහස් දක්වා නැත. |

| | | | |
|---|---|---|---|
| (ඊ) | මූල්‍ය ප්‍රකාශනවලට අනුව 2019 දෙසැම්බර් 31 දිනට ආයෝජන වටිනාකම රු.589,857,266 ක් වුවද ස්ථාවර තැන්පතු අළුත් කිරීමේ නිවේදන (Renewal Notes) අනුව එය රු.678,392,867 ක් වූයෙන් එදිනට මූල්‍ය ප්‍රකාශනවල ආයෝජන වටිනාකම රු.88,535,601 කින් අඩුවෙන් දක්වා තිබුණි. | ස්ථාවර තැන්පතු අළුත් කිරීමේ නිවේදන (Renewal Notes) අනුව වූ ආයෝජන වටිනාකම මූල්‍ය ප්‍රකාශනවල දැක්විය යුතුය. | අදහස් දක්වා නැත. |

1.7 ලේඛන හා පොත්පත් පවත්වා නොතිබිම

--------------------------------------------

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| | ------------------------- | ------------ | ------------------- |
| (අ) | මූල්‍ය ප්‍රකාශනවල සටහන 16 හි දක්වා ඇති රු.14,589,974 ක ක්ෂය සංචිත අරමුදලේ ශේෂය වාණිජ අත්තිකාරම් ගිණුම් දෙකකට ආදාළවේ. එසේ වුවත් එකී අත්තිකාරම් ගිණුම් දෙකට අදාළ ශේෂයන් වෙන වෙනම හඳුනාගත හැකි ආකාරයට පළාත් භාණ්ඩාගාරය විසින් වාර්තා පවත්වාගෙන ගොස් නොතිබුණි. | ක්ෂය සංචිත අරමුදලේ ශේෂය එක් එක් වාණිජ අත්තිකාරම් ගිණුම අනුව වෙන වෙනම හඳුනාගත හැකි ලෙස වාර්තා පවත්වාගෙන යා යුතුය. | අදහස් දක්වා නැත. |
| (ආ) | පළාත් භාණ්ඩාගාර අග්‍රිම ලැබීම් ලේඛනය, මධ්‍යම රජයේ අක්මුදල් ලැබීම් ප්‍රභවය වෙන්කර හඳුනාගත හැකි පරිදි පවත්වාගෙන ගොස් නොතිබුණි. | මධ්‍යම රජයේ අක්මුදල් ලැබීම් ප්‍රභවය වෙන්කර හඳුනාගත හැකි පරිදි අග්‍රිම ලැබීම් ලේඛනය පවත්වාගෙන යා යුතුය. | අදහස් දක්වා නැත. |

1.8 අග්‍රිම කළමනාකරණය

----------------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල සටහන 01 ප්‍රකාරව පළාත් අමාත්‍යාංශ 03 කට අදාළව පියවා නොතිබුණු රු.27,780,867 ක අග්‍රිම ශේෂයන් වර්ෂ 05 කට අධික කාලයක සිට පැවත එමින් තිබුණි. එම ශේෂයන්ගෙන් සියයට 95 ක් වූ වර්ෂ 09 කට අධික කාලයක සිට පැවත එන රු.26,405,861 ක ශේෂයක් ප්‍රධාන අමාත්‍යාංශය විසින් පියවිය යුතුව තිබුණි. | වර්ෂ 05 කට අධික කාලයක සිට පැවත එන අග්‍රිම ශේෂයන් අදාල පළාත් අමාත්‍යාංශ 03 විසින් පියවිය යුතුය. | අදහස් දක්වා නැත. |

1.9 ආදායම් කළමනාකරණය

-----------------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම. |
|---|---|---|
| ආදායම් සංකේත 08 කට අදාලව සමාලෝචිත වර්ෂයට ඇස්තමේන්තුගත ආදායම රු.3,525,350,000 ක් වූ අතර තථ්‍ය ආදායම රු.2,472,117,757 ක් වීමෙන් විචලනය රු.1,053,232,243 ක් විය. එකී විචලනය ඇස්තමේන්තුගත ආදායමෙන් සියයට 08 සිට සියයට 99 දක්වා පරාසයක විය. | ඇස්තමේන්තුගත ආදායමින් සියයට 70 ක් පමණක් අයකරගෙන ඇති අතර එය සියයට 85 මට්ටමවත් ඉක්මවිය යුතුවේ. | අදහස් දක්වා නැත. |

02. මූල්‍ය සමාලෝචනය

----------------------

2.1 මූල්‍ය ප්‍රතිඵලය

------------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා පළාත් සභා අරමුදලේ රු.40,527,608 ක ඌනතාවයක් වූ අතර, ඊට අනුරූපිව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.275,543,746 ක් විය. ඒ අනුව අරමුදලේ මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.316,071,354 ක පිරිහීමක් දක්නට ලැබුණි.

2.2 **ආදායම් හා වියදම් විචලනය**

**------------------------------**

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂය හා ඉකුත් වර්ෂය සඳහා ආදායම් හා වියදම් පිළිබඳ සාරාංශයක් පහත දැක්වේ.

| | 2019 | | | 2018 | | |
|---|---|---|---|---|---|---|
| | අයවැයගත | තථ්‍ය | විචලනය | අයවැයගත | තථ්‍ය | විචලනය |
| | රු. මිලියන | රු. මිලියන | රු. මිලියන | රු. මිලියන | රු. මිලියන | රු. මිලියන |
| ආදායම් | | | | | | |
| බදු ආදායම් | 4,017.5 | 3,040.6 | 976. 9 | 3,582.4 | 3,128.5 | 453.9 |
| බදු නොවන ආදායම් | 713.4 | 870.2 | (156.8) | 657.5 | 832.8 | (175.3) |
| රජයේ ප්‍රදාන | 19,851.0 | 16,680.6 | 3,170.4 | 18,099.9 | 14,624.7 | 3,475.2 |
| වෙනත් ලැබීම් | 100.0 | 966.7 | (866.7) | 4,826.4 | 2,137.6 | 2,688.8 |
| එකතුව | 24,681.9 | 21,558.1 | 3,123.8 | 27,166.2 | 20,723.6 | 6,442.6 |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| පුනරාවර්තන වියදම් | | | | | | |
| පෞද්ගලික පඩිනඩි | 15,458.4 | 15,741.6 | (283.2) | 14,191.1 | 14,521.9 | (330.8) |
| අනෙකුත් වියදම් | 4,918.9 | 5,154.4 | (235.5) | 4,123.8 | 4,603.5 | (479.7) |
| උප එකතුව | 20,377.3 | 20,896.0 | (518.7) | 18,314.9 | 19,125.4 | (810.5) |
| ප්‍රාග්ධන වියදම් | 4,068.0 | 702.7 | 3,365.3 | 3,921.3 | 1,322.7 | 2,598.6 |
| එකතුව | 24,445.3 | 21,598.7 | 2,846.6 | 22,236.2 | 20,448.1 | 1,788.1 |

(අ) සමාලෝචිත වර්ෂයේ බදු හා බදු නොවන ආදායම්වල එකතුව රු.3,910,898,986 ක් වූ අතර, ඉකුත් වර්ෂයේ එම ආදායම රු.3,961,288,775 ක් වූයෙන් සමාලෝචිත වර්ෂයේ බදු හා බදු නොවන ආදායම අඩුවීම රු.50,389,789 ක් විය.

(ආ) සමාලෝචිත වර්ෂයේ පළාත් ආයෝජන වියදම රු.702,686,653 ක් වූ අතර ඉකුත් වර්ෂයේ එය රු.1,271,521,856 ක් වූයෙන් ආයෝජන වියදම රු.568,835,203 කින් හෙවත් සියයට 45 කින් අඩුවී තිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂයේ මුළු වියදම වූ රු.21,598,665,655 න් ආයෝජන වියදම රු.702,686,653 ක් වූයෙන් පළාත් සංවර්ධන කටයුතු සඳහා දරන ලද වියදම මුළු වියදමෙන් සියයට 03 ක් වී තිබුණි.

(ඈ) සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් කල්බදු වාරික ගෙවීම් රු.18,847,396 ක් වූ අතර ඉකුත් වර්ෂයේ එය රු.3,806,040 ක් වූයෙන් එකී වියදම රු.15,041,356 කින් හෙවත් සියයට 395 කින් වැඩිවී තිබුණි.

## 03. ප්‍රඥප්ති ගිණුම්/අරමුදල් ගිණුම්/වාණිජ අත්තිකාරම් ගිණුම් හා අනෙකුත් අත්තිකාරම් ගිණුම්

---------------------------------------------------------------------------------------------------

### 3.1 උතුරු මැද පළාත් මාර්ග සංවර්ධන අධිකාරිය

-------------------------------------------------

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම. |
|---|---|---|---|
| | ----------------------- | ------------- | ----------------------------- |
| (අ) | ඉකුත් වර්ෂවලදී අධිකාරියේ සේවකයන්ට ගෙවා තිබුණු නමුත් නැවත අයකරගෙන නොතිබුණු ණය වටිනාකම රු.776,511 ක් වූ අතර ඒ සඳහා පොලී ගණනය කිරීමක් සිදුකර නොතිබුණි. | අයවීම් හිඟහිට ඇති සියළු ණය ශේෂයන් ඒවාට අදාල පොලිය සමඟ අයකර ගත යුතුවේ. | ඉදිරියේදී අයකර ගැනීමට කටයුතු කරන බව දන්වමි. |
| (ආ) | මහා මාර්ග දෙපාර්තමේන්තුවේ සේවක ණය ලෙස වර්ෂ 12 ක පමණ කාලයක සිට මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන රු.158,082 ක මුදලක් අයකර ගැනීම සඳහා කටයුතු කර නොතිබුණි. | පැරණි ණය ශේෂයන් අදාල සේවකයින්ගෙන් අයකර ගැනීමට කටයුතු කලයුතු වේ. | මෙම ණයගැතියන් මිය ගොස් ඇති අතර ඇපකරුවන් ආයතනයේ නැති බැවින් එකී ශේෂය කපා හැරීමට ඉදිරියේදී කටයුතු කරන බව දන්වමි. |
| (ඇ) | අධිකාරිය සතු ජංගම නොවන වත්කම්වල මිලදී ගත් දිනය, ප්‍රමාණය සහ වටිනාකම් යනාදි තොරතුරු ඇතුළත් කරමින් වත්කම් කළමනාකරණ පද්ධතිය යාවත්කාලීන කර නොතිබීම, වත්කම් ප්‍රත්‍යාගණනය කිරීමකින් තොරව විෂයභාර නිලධාරිනියගේ අවබෝධය මත වත්කම් අගයකර වත්කම් කළමනාකරණ පද්ධතියට ඇතුළත් කර තිබීම, වත්කම් කළමනාකරණ පද්ධතිය හා මූල්‍ය ප්‍රකාශනවල පවතින අගයන් අතර ගැලපීම් නොකිරීම යනාදිය හේතුවෙන් අධිකාරිය සතු වත්කම්වල වටිනාකමෙහි | අධිකාරිය සතු ජංගම නොවන වත්කම්වල වටිනාකම් නිවැරදි ලෙස මූල්‍ය ප්‍රකාශනවල දක්වා ඇති බව තහවුරු කල යුතුවේ. | අදහස් දක්වා නැත. |

| | | | |
|---|---|---|---|
| | නිවැරදිතාවය පිළිබඳව විගණනයේදී සෑහීමකට පත්විය නොහැකි විය. | | |
| (ඇ) | පළාත් මාර්ග සංවර්ධන අධිකාරියේ එකතුකල අගය මත බදු ගොනුව 2015 සැප්තැම්බර් මාසයේ සිට අක්‍රීය තත්ත්වයට පත්කර තිබුණු නමුත් අධිකාරිය විසින් 2015 සැප්තැම්බර් 03 දින සිට 2017 දෙසැම්බර් 31 දින දක්වා කාලය තුළ රු.5,357,471 ක් හා සමාලෝචිත වර්ෂයේදී රු.4,610,044 ක් වශයෙන් එකතුව රු.9,967,515 ක එකතු කළ අගය මත බදු ගනුදෙනුකරුවන්ගෙන් රැස්කරගෙන තිබුණි. | එකතුකල අගය මත බදු ගොනුව අක්‍රීය තත්ත්වයට පත්ව ඇති බැවින් ගනුදෙනුකරුවන් ගෙන් එකී බදු අය නොකල යුතුවේ. | දේශීය ආදායම් දෙපාර්තමේන්තුව සමඟ සාකච්ඡා කර එකතුකල අගය මත බදු ගොනුව සක්‍රීය කර ගෙන නිරවුල් කිරීමට කටයුතු කරන බව දන්වමි. |

3.2 **ප්‍රධාන අමාත්‍ය අරමුදල**

---------------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම. |
|---|---|---|
| 1992 අංක 5 දරන ප්‍රධාන අමාත්‍ය අරමුදල ප්‍රඥප්තියේ 3(1) වගන්තිය මඟින් අරමුදලේ පරිපාලනය, කළමනාකරණය සහ ප්‍රාග්ධනය එහි පාලක මණ්ඩලය වෙත පවරා තිබුණි. අරමුදලේ පාලක මණ්ඩලය ප්‍රධාන අමාත්‍යවරයා සහ විපක්ෂයේ මන්ත්‍රීවරුන් දෙදෙනෙකු ඇතුළු 06 දෙනෙකුගෙන් සමන්විත වූ අතර පළාත් සභාව විසුරුවා හැරීමෙන් පසුව අරමුදල, පවත්වාගෙන යා යුතු ක්‍රමවේදය ප්‍රඥප්තියේ දක්වා නොතිබුණු බැවින් පළාත් සභාව විසුරුවා හරිනලද 2017 ඔක්තෝබර් 01 දින සිට අරමුදල අක්‍රීයවී පැවතුණි. | පළාත් සභාව විසුරුවා හැරීමෙන් පසුව අරමුදල, පවත්වාගෙන යා යුතු ක්‍රමවේදය හෝ අක්‍රීය වන බව හෝ දක්වමින් ප්‍රඥප්තිය සංශෝධනය කල යුතු වේ. | පළාත් සභාව විසුරුවා හැර ඇති බැවින් ප්‍රඥප්තිය සංශෝධනය කල නොහැකි බව දන්වමි. |

04. මෙහෙයුම් සමාලෝචනය

----------------------------

4.1 කාර්යසාධනය

-----------------

4.1.1 රජයේ ප්‍රදාන

----------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම. |
| --- | --- | --- |
| එකතුව රුපියල් මිලියන 3,761 ක අනුමත රජයේ ප්‍රදාන වලින් සියයට 50 ක් වූ රුපියල් මිලියන 1,896 ක ප්‍රතිපාදන උපයෝජනය කර නොතිබුණි. | අනුමත ප්‍රතිපාදන උපරිම වශයෙන් උපයෝජනය කල යුතුවේ. | අදහස් දක්වා නැත. |

4.1.2 පළාත් සංවර්ධන සැලැස්ම

----------------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම. |
| --- | --- | --- |
| සමාලෝචිත වර්ෂය සඳහා පළාත් සංවර්ධන සැලැස්ම යටතේ නව වැඩ හා අවිච්ඡේද වැඩ වෙනුවෙන් ඇස්තමේන්තු වටිනාකම රුපියල් මිලියන 3,487 ක් වූ යෝජනා 1,437 ක් අනුමත කර තිබුණි. එසේ වුවත් ඉන් සියයට 50 ට වඩා අඩුවෙන් නිමකල සහ ආරම්භකර නොතිබුණු වැඩ යෝජනා ගණන 116 ක් වූ අතර ඒවායේ ඇස්තමේන්තුගත වටිනාකම රුපියල් මිලියන 394 ක් විය. | සියළුම මුදල් සැලසුම් ප්‍රකාරව උපයෝජනය කල යුතුවේ. | අදහස් දක්වා නැත. |

4.1.3 අධ්‍යාපනය

------------

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම. |
|---|---|---|---|
| (අ) | 2001 මැයි 24 දිනැති අංක 1/වි.අ/2/84 දරන අධ්‍යාපන අමාත්‍යාංශ ලේකම්ගේ චක්‍රලේඛයේ 01 ඡේදය ප්‍රකාරව විශේෂ අධ්‍යාපන ඒකකයකට දරුවන් ඇතුලත් කර ගැනීමේදී, විශේෂ අධ්‍යාපන විෂයභාර නියෝජ්‍ය අධ්‍යාපන අධ්‍යක්ෂ, සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්, විශේෂ අධ්‍යාපන විෂයභාර ගුරු උපදේශකවරුන්, විශේෂ අධ්‍යාපන ගුරුභවතුන් ප්‍රාථමික අංශය /විෂයභාර ගුරුභවතුන් යන අයගෙන් 03 දෙනෙකුගෙන් සමන්විත කමිටුවක් මඟින් විශේෂ අවශ්‍යතා සහිත දරුවන් හඳුනා ගැනීම කලයුතු වේ. එසේ වුවත් උතුරුමැද පළාත තුල එම ක්‍රමවේදයෙන් බැහැරව කටයුතු කිරීම නිසා සාමාන්‍ය පන්ති කාමරයක අධ්‍යාපනය ලබා දිය යුතු කියවීමේ හා ලිවීමේ හැකියාව අවම මට්ටමක පවතින දරුවන්, පූර්ව ළමාවිය අධ්‍යාපනයක් ලබා නොමැති දරුවන්, ඉතා දිළිඳු පවුල්වල සාමාන්‍ය දරුවන් සහ පිරිසිදුකමින් හා පිළිවෙලින් අඩු දරුවන් බොහොමයක් විශේෂ අධ්‍යාපන ඒකකවලට යොමු කර තිබුණි. | විශේෂ අධ්‍යාපන ඒකකයකට දරුවන් ඇතුලත් කර ගැනීමේදී, චක්‍රලේඛයේ දක්වා ඇති නිලධාරීන් 03 දෙනෙකුගෙන් සමන්විත කමිටුවක් මඟින් විශේෂ අවශ්‍යතා සහිත දරුවන් හඳුනා ගැනීම කලයුතු වේ. | චක්‍රලේඛයේ 01 ඡේදය ප්‍රකාරව පත්කර ගන්නා කමිටුවක් මඟින් විශේෂ අවශ්‍යතා සහිත දරුවන් හඳුනා ගැනීම ඉදිරියේදී සිදුකරන බව දන්වමි. |
| (ආ) | 2012 නොවැම්බර් 23 දිනැති අංක 42/2012 දරන අධ්‍යාපන අමාත්‍යාංශ ලේකම්ගේ චක්‍රලේඛයේ පස්වන ඡේදය ප්‍රකාරව විශේෂ අධ්‍යාපන ක්ෂේත්‍රය සඳහා පත්වීම් ලබා ඇති ගුරුවරුන්, පත්වීම් ලිපියෙහි කුමන අනු විෂයයක් සඳහන් වුවද ප්‍රධාන විෂයය වන | විශේෂ අධ්‍යාපන ක්ෂේත්‍රය සඳහා පත්වීම් ලබා ඇති ගුරුවරුන්, විශේෂ අධ්‍යාපන ක්ෂේත්‍රයෙහිම | අදහස් දක්වා නැත |

| | | | |
|---|---|---|---|
| | විශේෂ අධ්‍යාපන ක්ෂේත්‍රයෙහිම සේවය කිරීම අනිවාර්යවේ. එසේ වුවත් විශේෂ අධ්‍යාපන ඒකකයක ඉගැන්වීම සඳහා විධිමත් පුහුණුව ලබා ඇති ගුරුභවතුන් 20 දෙනෙකු උතුරු මැද පළාත තුල වෙනත් විෂයයන් ඉගැන්වීම සඳහා යොදවා තිබුණි. | සේවයේ යෙදවිය යුතුවේ. | |
| (ඇ) | 2012 නොවැම්බර් 23 දිනැති අංක 42/ 2012 දරන අධ්‍යාපන අමාත්‍යාංශ ලේකම්ගේ චක්‍රලේඛය ප්‍රකාරව විශේෂ අධ්‍යාපන ඒකක සඳහා අවම වශයෙන් ශිෂ්‍යයන් 05 කට එක් ගුරුවරයෙකු බැගින්වත් එම ක්ෂේත්‍රයෙහි පුහුණුව ලබා ඇති ගුරුවරුන් පත් කල යුතු වේ. එසේ වුවත් උතුරු මැද පළාතේ අධ්‍යාපන කලාප 08 හි විශේෂ අධ්‍යාපන ඒකක පවතින පාසල් 24 ක එම ක්ෂේත්‍රයෙහි පුහුණුව ලැබූ ගුරුභවතුන් 29 දෙනෙකුගේ පුරප්පාඩු පැවතුණි. | චක්‍රලේඛය ප්‍රකාරව අවම වශයෙන් ශිෂ්‍යයන් 05 කට එක් ගුරුවරයෙකු බැගින්වත් විශේෂ අධ්‍යාපන ක්ෂේත්‍රයෙහි පුහුණුව ලබා ඇති ගුරුවරුන් පත් කල යුතු වේ. | අදහස් දක්වා නැත. |
| (ඈ) | උතුරු මැද පළාතේ අධ්‍යාපන කලාප 08 හි ඇති අධ්‍යාපන කොට්ඨාශ 30 න් කොට්ඨාශ 04 ක විශේෂ අධ්‍යාපන ඒකක ස්ථාපිත කිරීමට කටයුතු කර නොතිබීම නිසා එම අධ්‍යාපන කොට්ඨාශවල සිටින විශේෂිත අවශ්‍යතා සහිත දරුවන්ට විශේෂ අධ්‍යාපනය ලැබීමේ අවස්ථාව අහිමි වී තිබුණි. | විශේෂිත අවශ්‍යතා සහිත දරුවන්ට විශේෂ අධ්‍යාපනය ලබා ගැනීමට හැකිවන ලෙස සියළුම අධ්‍යාපන කොට්ඨාශවල විශේෂ අධ්‍යාපන ඒකක ස්ථාපිත කලයුතු වේ. | අදහස් දක්වා නැත |
| (ඉ) | 2017 වර්ෂයේදී උතුරු මැද පළාතේ අධ්‍යාපන කලාප 03 කට අයත් පාසල් 13 ක රුපියල් මිලියන 18.48 ක වියදමින් විශේෂ අධ්‍යාපන ඒකක සඳහා ගොඩනැගිලි නවීකරණය කර තිබුණද, 2019 වර්ෂය අවසාන වන විටත් එකී විශේෂ අධ්‍යාපන | විශේෂ අධ්‍යාපන ඒකක අවශ්‍ය පාසල් නිවැරදිව හඳුනා ගෙන ගොඩනැගිලි නවීකරණය කිරීමට හා නව ගොඩනැගිලි | අදහස් දක්වා නැත |

| | | | |
|---|---|---|---|
| | ඒකක ක්‍රියාත්මක කර නොතිබුණු අතර තවත් පාසල් 12 ක විශේෂ අධ්‍යාපන ඒකක සඳහා සුදුසු ගොඩනැඟිලි ලබා දී නොතිබුණි. ඒ අනුව විශේෂ අධ්‍යාපන ඒකක අවශ්‍ය පාසල් නිවැරදිව හඳුනා ගෙන ගොඩනැගිලි නවීකරණය කිරීමට හා නව ගොඩනැගිලි ඉදි කිරීමට බලධාරීන් කටයුතු කර නොතිබුණි. | ඉදි කිරීමට බලධාරීන් කටයුතු කලයුතු වේ. | |
| (ඊ) | 2007 මැයි 14 දිනැති අංක 2007/9 දරන අධ්‍යාපන අමාත්‍යාංශ ලේකම්ගේ චක්‍රලේඛය ප්‍රකාරව පාසල් ගොඩනැඟිලි ඉදිකිරීමේදී හා නවීකරණය කිරීමේදී ආබාධ සහිත තැනැත්තන් සඳහා ප්‍රවේශ පහසුකම් සැලසීම පිළිබඳ දැඩි අවධානය යොමු කල යුතු අතර පාසල් තුල ප්‍රවේශ පහසුව සැලසීම අනිවාර්ය වේ. එසේ වුවත්, උතුරු මැද පළාතේ පාසල් 14 ක පවතින විශේෂ අධ්‍යාපන ඒකක සඳහා සුදුසු පරිදි ප්‍රවේශ පහසුකම් සකස් කර නොතිබුණි. | උතුරු මැද පළාතේ පවතින විශේෂ අධ්‍යාපන ඒකක සඳහා ආබාධ සහිත තැනැත්තන් වෙනුවෙන් ප්‍රවේශ පහසුකම් සැලසිය යුතු වේ. | අදහස් දක්වා නැත |
| (උ) | 2017 ජනවාරි 30 දිනැති අංක ED/09/18/02/01/2 දරන අධ්‍යාපන අමාත්‍යාංශ ලේකම්ගේ චක්‍රලේඛය ප්‍රකාරව අධ්‍යාපන ආඥා පනතේ 37 වන වගන්තිය හා අංක 1963/30 දරන අති විශේෂ ගැසට් නිවේදනය අනුව වයස අවුරුදු 5-16 වයසේ පසුවන සියළුම දරුවන් අනිවාර්යයෙන්ම අධ්‍යාපනයට යොමු කිරීමේ වැඩපිළිවෙල ක්‍රියාත්මක කිරීම සඳහා පාසල් කමිටුව සහ අධීක්ෂණ කමිටුව ක්‍රියාත්මක කල යුතු වුවත් පළාත තුල පිහිටි පෝෂක ප්‍රදේශවල විශේෂ අධ්‍යාපන අවශ්‍යතා සහිත දරුවන් හඳුනාගෙන පාසල්වල විශේෂ අධ්‍යාපන ඒකකවලට යොමු කිරීමේ ක්‍රියාවලිය ක්‍රියාත්මක කල බවට සාක්ෂි නොවීය. | අධ්‍යාපන ආඥා පනතේ 37 වන වගන්තිය හා අංක 1963/30 දරන අති විශේෂ ගැසට් නිවේදනය අනුව වයස අවුරුදු 5-16 වයසේ පසුවන සියළුම දරුවන් අනිවාර්යයෙන්ම අධ්‍යාපනයට යොමු කිරීමට කටයුතු කලයුතු වේ. | අදහස් දක්වා නැත |

4.1.4 සෞඛ්‍ය

----------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම. |
| --- | --- | --- |
| අනුරාධපුර ගල්කිරියාගම ප්‍රාදේශීය රෝහලේ වෛද්‍යවරුන් දෙදෙනෙකු 2019 වර්ෂයේදී සේවයට නොපැමිණි දිනවල සේවයට පැමිණි බවට දින පොත් ලියා තිබුණු බව නිරීක්ෂණය විය. ඉන් කාර්යභාර වෛද්‍ය නිලධාරී ලෙස සේවය කල එක් වෛද්‍යවරයෙකු සේවයට නොපැමිණි දින 99 ක දී පැය 396 ක අතිරේක රාජකාරී දීමනා ලෙස රු.385,856 ක් හා සේවයට නොපැමිණි දින 06 කට නිවාඩු දින රාජකාරී දීමනා ලෙස රු.25,739 ක් ද, අනෙක් වෛද්‍යවරයා සේවයට නොපැමිණි දින 67 කදී පැය 268 ක අතිරේක රාජකාරී දීමනා ලෙස රු.146,060 ක් හා සේවයට නොපැමිණි දින 04 කට නිවාඩු දින රාජකාරී දීමනා ලෙස රු.9,732 ක් ද ලබාගෙන තිබුණි. කාර්යභාර වෛද්‍ය නිලධාරීවරයා සේවා මුර සටහන් සකස් කර තිබුණේ වර්ෂයේ මාස 03 ක් සඳහා පමණි. | රේඛීය අමාත්‍යාංශය සහ ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාලය වෙත ත්‍රෛමාසිකව යවනු ලබන නේවාසික රෝගීන් සම්බන්ධ වාර්තා සහ බාහිර රෝගීන් සම්බන්ධ වාර්තා එක් එක් වෛද්‍යවරයාට අදාලව වෙන වෙනම පිළියෙල කල දෛනිකව විද්‍යුත් තැපැල මගින් යොමු කිරීමට සියළුම රෝහල් වෙත නියම කල යුතුය. | අදහස් දක්වා නැත |

4.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

-------------------------------------

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම. |
| --- | --- | --- | --- |
| (අ) | ඉකුත් වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල සටහන 5 (1) හි ප්‍රාදේශීය ලේකම් කාර්යාල 09 කට අදාළ පළාත් රාජ්‍ය නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම් 09 ක ණය ගැතියන් හා ණය හිමියන් සොයාගත නොහැකි රු.1,399,872 ක හර | සියළුම ණයගැති හා ණයහිමි ශේෂයන් ඉතා කඩිනමින් නිරවුල් කිරීමට කටයුතු කලයුතු වේ. | අදහස් දක්වා නැත |

| | | |
|---|---|---|
| ශේෂයන් 07 ක් හා රු.44,202 ක බැර ශේෂයන් 02 ක් පැවති අතර සමාලෝචිත වර්ෂය අවසාන වන විට ප්රාදේශීය ලේකම් කාර්යාල 08 ක නිරවුල් නොකල හර ශේෂය රු.1,410,326 ක් වී තිබුණි. | | |
| (ආ) ප්‍රාදේශීය ලේකම් කාර්යාල 29 න් 27 ක් විසින් ඉදිරිපත් කර තිබුණු ශේෂ සනාථ කිරීම් අනුව රු.80,648,015 ක් වූ පොදු තැන්පත් ගිණුම් ශේෂ එකතුව මූල්‍ය ප්‍රකාශන අනුව රු.81,071,012 ක් වීමෙන් නොසැසඳුණු වෙනස රු.422,997 ක් විය. එසේම ප්‍රාදේශීය ලේකම් කාර්යාල විසින් ඉදිරිපත් කර තිබුණු කාල විශ්ලේෂණ සහ ශේෂ සනාථ කිරීම් අනුව අවුරුදු 02 කට අධික කාලයක් ඉක්මවූ නිරවුල් නොකල පොදු තැන්පතු ශේෂය රු.22,177,873 ක් විය. | නොසැසඳුණු වෙනසට හේතු සොයා එය නිවැරදි කිරීම සහ අවුරුදු 02 කට අධික තැන්පතු සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කිරීම සිදුකල යුතුවේ. | අදහස් දක්වා නැත |

4.3 දූෂණ අක්‍රමිකතා

--------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම. |
|---|---|---|
| ---------------------- | ------------- | ---------------------- |
| ළඟම පාසල හොඳම පාසල ව්‍යාපෘති ප්‍රතිපාදන මත සිදුකල ඉදිකිරීම් වෙනුවෙන් මැනුම්පත්, වැඩ අවසාන වාර්තාව හා බිල්පත් ගෙවීම් සාරාංශය ඇතුළු ලියකියවිලිවල මුල් පිටපත් මත එක් අවස්ථාවකදී සහ එකී ලියකියවිලිවල ඡායා පිටපත් මත තවත් අවස්ථාවකදී වශයෙන් ද්විත්ව ගෙවීම් සිදුකර තිබුණි. විගණන නියැදි පරීක්ෂණයේදි 2020 පෙබරවාරි 26 දින වනවිට ද්විත්ව ගෙවීම් මගින් වංචනිකව ලබාගෙන තිබුණු මුදල රු.8,608,290 ක් විය. | වංචනිකව ලබාගෙන තිබුණු රු.8,608,290 ක මුදල වහාම අයකරගත යුතු අතර වංචනික නිලධාරීන්ට එරෙහිව විනයානුකූලව කටයුතු කලයුතු වේ. | ද්විත්ව ගෙවීම් මත වැඩිපුර ගෙවා ඇති මුදල් අයකරමින් පවතින අතර අදාල නිලධාරීන්ට එරෙහිව විනය පරීක්ෂණ ආරම්භ කර ඇතිබව දක්වා ඇත. |

4.4 කොන්ත්‍රාත් පරිපාලනයේ අඩුපාඩු

-------------------------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ/ ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම. |
|---|---|---|
| (අ) තඹුත්තේගම පුස්තකාල සේවා මණ්ඩල ගොඩනැගිල්ල ඉදිකිරීම | | |
| උතුරු මැද පළාත් ප්‍රධාන අමාත්‍යාංශය විසින් විශේෂ ව්‍යාපෘති යටතේ 2016 වර්ෂයේදී තඹුත්තේගම පුස්තකාල සේවා මණ්ඩල ගොඩනැගිල්ල ඉදිකිරීම සඳහා රු.24,987,271 ක මුදලකට කොන්ත්‍රාත්කරුවෙකු සමඟ ගිවිසුම් ගතවී තිබුණි. | | |
| (i) ප්‍රසම්පාදන මාර්ගෝපදේශ 6.2.2 ප්‍රකාරව විභව ලංසුකරුවන්ට මිළ ගණන් ඉදිරිපත් කිරීම සඳහා ලබාදිය යුතු අවම දින 21 ක කාලය ලබා නොදී දින 05 ක කාලයක් පමණක් ලබාදීම නිසා ඉදිරිපත්කර තිබුණේ එක් ලංසුවක් පමණි. | විභව ලංසුකරුවන්ට මිළ ගණන් ඉදිරිපත් කිරීම සඳහා අවම දින 21 ක කාලයක් ලබාදිය යුතුවේ | අවම දින 21 ක කාලය ලබාදීම දැනට සිදුවන බව දන්වමි. |
| (ii) ගිවිසුම් ප්‍රකාරව 2017 පෙබරවාරි 22 දින ඉදිකිරීම් අවසන් කලයුතු වුවත් 2019 ජනවාරි 10 දින අවසන් කර තිබුණු බැවින් ගිවිසුම් ප්‍රකාරව අයකල යුතු රු.2,498,727 ක ප්‍රමාද ගාස්තු අයකරගෙන නොතිබුණි. | ගිවිසුම් ප්‍රකාරව අයකල යුතු රු.2,498,727 ක ප්‍රමාද ගාස්තු අයකරගත යුතු වේ. | අදහස් දක්වා නැත |

| | | |
|---|---|---|
| (iii) රු.25,204,783 ක් වැයකර ඉදිකර තිබුණු මෙම ගොඩනැගිල්ල 2020 ජූලි 15 දින වන විටත් විවෘත නොකර අවුරුද්දකට අධික කාලයක් නිෂ්ක්‍රීයව පැවතුණි. | 2020 සැප්තැම්බර් 30 දින වන විටත් විවෘතකර නොතිබුණු මෙම ගොඩනැගිල්ල කඩිනමින් විවෘත කලයුතු වේ. | අදහස් දක්වා නැත |
| (ආ) ලඟම පාසල හොඳම පාසල ව්‍යාපෘතියේ ප්‍රතිපාදන මත සිදුකර තිබුණු ඉදිකිරීම් | | |
| ------------------------------------------------ | | |
| 2016 සහ 2017 වර්ෂවලදී ළඟම පාසල හොඳම පාසල ව්‍යාපෘතියේ ප්‍රතිපාදන යොදවා උතුරු මැද පළාතේ පාසල්වල ක්‍රියාත්මක කර තිබුණු ඉදිකිරීම් පිළිබඳව අනාවරණය වූ කරුණු පහත දැක්වේ. | | |
| (i) ගිවිසුම්ගත මුදල රු.21,946,785 ක් වූ ඉදිකිරීම් කොන්ත්‍රාත් 02 ක් වෙනුවෙන් රු.9,066,775 ක වැඩ ආරම්භ කිරීමේ අත්තිකාරම් ගෙවා ඇති නමුත් ගිවිසුම් ප්‍රකාරව වැඩ අවසන් කර නොතිබුණු බව නියැදි විගණනයේදී අනාවරණය විය. එසේ වුවත් එකී අත්තිකාරම් අයකර ගැනීමට සහ ගිවිසුම් ප්‍රකාරව වැඩ නිමනොකල කොන්ත්‍රාත්කරුවන් සම්බන්ධයෙන් නීතිමය කටයුතු සිදුකර නොතිබුණි. | ගිවිසුම් ප්‍රකාරව වැඩ අවසන් කර නොතිබුණු කොන්ත්‍රාත් වලට අදාලව ගෙවා තිබුණු අත්තිකාරම් අයකර ගැනීමට සහ ගිවිසුම් ප්‍රකාරව වැඩ නිමනොකල කොන්ත්‍රාත්කරුන් සම්බන්ධයෙන් නීතිමය කටයුතු සිදුකල යුතුවේ. | අදහස් දක්වා නැත. |

| | | |
|---|---|---|
| (ii)ඉංජිනේරු ඇස්තමේන්තු වටිනාකම රු.1,707,275 ක් වූ උප ව්‍යාපෘතියක් අනුමත සමිතියකට ප්‍රදානය කිරීමේදී එකී ඉංජිනේරු ඇස්තමේන්තුවට වඩා රු.292,725 කින් වැඩි වටිනාකමකට ගිවිසුම් අත්සන් කර තිබුණි. | අනුමත සමිතිවලට කොන්ත්‍රාත් ප්‍රදානය කිරීමේ වටිනාකම ඉංජිනේරු ඇස්තමේන්තුව නොඉක්ම විය යුතුවේ. | දැනට ඉංජිනේරු ඇස්තමේන්තුවට කොන්ත්‍රාත් ප්‍රදානය කරන බව දන්වමි. |

4.5 ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම

------------------------------

4.5.1 ප්‍රමාද වූ ව්‍යාපෘති

------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම. |
|---|---|---|
| ඉදිකිරීම සඳහා නිශ්චිත ස්ථානයක් හඳුනා නොගෙන ව්‍යාපෘතිය සැලසුම් කිරීම, ඉංජිනේරු ඇස්තමේන්තු පිළියෙල කිරීම හා ලංසු ලියවිලි සකස් කිරීම යනාදිය සිදුකර තිබුණු මුල් ළමාවිය සංවර්ධන අධිකාරියේ පරිපාලන සම්පත් මධ්‍යස්ථාන ගොඩනැගිල්ල ඉදිකිරීම සඳහා රු.24,267,211 ක මුදලකට ප්‍රධාන අමාත්‍යාංශය 2017 ජූලි 31 දින ගිවිසුම් අත්සන් කර තිබුණි. පසුව අනුරාධපුර මහනගර සභා බල ප්‍රදේශයේ භූමියක ඉදිකිරීම් ආරම්භ කර ඇතත් සංවර්ධන බලපත්‍රය ලබාගැනීමට කටයුතු නොකිරීම සහ එකඟතාවය ලබාදුන් පරිදි ගොඩනැගිල්ල ඉදිකිරීමට කටයුතු නොකිරීම හේතුවෙන් ව්‍යාපෘතියෙහි වැඩ අතරමඟ නවතා දමා තිබුණු අතර ව්‍යාපෘතිය සඳහා ගෙවා ඇති රු.2,079,562 ක මුදල නිෂ්ඵල වියදමක් වී තිබුණි. | නිශ්චිත ස්ථානයක් හඳුනාගැනීමෙන් පසුව ව්‍යාපෘතිය සැලසුම් කිරීම, ඉංජිනේරු ඇස්තමේන්තු පිළියෙල කිරීම හා ලංසු ලියවිලි සකස් කිරීම යනාදිය සිදුකල යුතුවේ. | ඉදිරියේදී ස්ථානයක් හඳුනාගැනීමෙන් පසුව ව්‍යාපෘතිය සැලසුම් කිරීම, ඉංජිනේරු ඇස්තමේන්තු පිළියෙල කිරීම හා ලංසු ලියවිලි සකස් කිරීම යනාදිය සිදුකරන බව දන්වමි. |

4.6 වත්කම් කළමනාකරණය

-------------------------------

නිශ්ක්‍රීය වත්කම්

---------------------

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම. |
|---|---|---|---|
| | ----------------------- | ------------- | ------------------------ |
| (අ) | ළඟම පාසල හොඳම පාසල ව්‍යාපෘතිය යටතේ රු.36,643,690 ක් වැයකර ඉදිකර තිබුණු මුදුනේගම මහා විද්‍යාලයේ කණිෂ්ඨ, ද්විතියික ප්‍රාථමික විද්‍යාගාර ගොඩනැගිල්ල 2019 මාර්තු 01 දින විවෘත කර තිබුණු නමුත් විදුලි සම්බන්ධතාවය නොමැතිවීම හේතුවෙන් වර්ෂයකට අධික කාලයක් නිෂ්ක්‍රීයව පැවතුණි. | 2020 සැප්තැම්බර් වන විටත් නිෂ්ක්‍රීයව පවතින මෙම ගොඩනැගිල්ල ප්‍රයෝජනයට ගතයුතු වේ. | විදුලි සම්බන්ධතාවය ලබාගැනීමට කටයුතුකර ඇති බව දන්වමි. |
| (ආ) | ගලෙන්බිඳුණුවැව අධ්‍යාපන කලාපයේ පාසල්වල පැවති නිල නිවාස 25 න් නිල නිවාස 22 ක් ගුරුවරුන්ට ලබා දීමට කටයුතු නොකිරීම නිසා නිෂ්ක්‍රීයව පැවතුණි. | 2020 සැප්තැම්බර් වන විටත් නිෂ්ක්‍රීයව පවතින මෙම නිල නිවාස 22 ක ගුරුවරුන්ට ලබා දීමට කටයුතු කලයුතු වේ. | අදහස් දක්වා නැත. |
| (ඇ) | වර්ෂ 05 ත් 20 ත් අතර කාලයකට පෙර වසාදමා තිබුණු ගලෙන්බිඳුණුවැව අධ්‍යාපන කලාපයේ පාසල් 04 ක පැවති වත්කම් වෙනත් බාහිර පාර්ශවයන් විසින් ප්‍රයෝජනයට ගනු ලබන නමුත් ඒවා විධිමත්ව පවරා දීමට කටයුතු කර නොතිබුණි. | පාසල් 04 හි පැවති වත්කම් ප්‍රයෝජනයට ගනු ලබන පාර්ශවයන් වෙත පවරාදීමට කටයුතු කලයුතු වේ. | අදහස් දක්වා නැත. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | කලාප අධ්‍යාපන කාර්යාල 08 හි විශේෂ අධ්‍යාපනය වෙනුවෙන් ලබාදී තිබුණු මුදලින් 2015 වර්ෂයේදී රු.435,449 ක්, 2016 වර්ෂයේදී රු.341,731 ක්, 2017 වර්ෂයේදී රු.358,730 ක් සහ 2018 වර්ෂයේදී රු.378,239 ක් වශයෙන් රු.1,514,149 ක් උපයෝජනය කර නොතිබුණි. | කලාප අධ්‍යාපන කාර්යාල වෙත ලබාදෙන සියළුම මුදල් සම්පූර්ණයෙන්ම උපයෝජනය කලයුතුවේ. | ඉදිරියේදී ලැබෙන මුදල් සම්පූර්ණයෙන්ම උපයෝජනය කිරීමට කලාප අධ්‍යක්ෂවරුන්ට උපදෙස් දී ඇති බව දන්වමි. |

## 4.7 කාර්ය මණ්ඩල පරිපාලනය

### 4.7.1 පළාත් සභා අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු හා ආයතන

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම. |
|---|---|---|---|
| (අ) | පළාත් පරිවාස හා ළමා රක්ෂක සේවා දෙපාර්තමේන්තුවේ 186 ක් වූ අනුමත කාර්ය මණ්ඩලයේ තනතුරු 18 ක පුරප්පාඩු 78 ක් පැවතීම එහි කාර්ය සාධනය කෙරෙහි අහිතකර ලෙස බලපා තිබුණි. | තනතුරු 18 ක පවතින පුරප්පාඩු සඳහා නිලධාරීන් බඳවා ගැනීමට කටයුතු කලයුතු වේ. | බඳවා ගැනීම සඳහා අනුමැතිය ඉල්ලා යවා ඇත. |
| (ආ) | පළාත් සමාජ සේවා දෙපාර්තමේන්තුවේ අත්‍යාවශ්‍ය තනතුරුවල පවතින පුරප්පාඩු 21 ක් සම්පූර්ණ කිරීමට පියවර නොගැනීම දෙපාර්තමේන්තුවේ කාර්යය සාධනය කෙරෙහි අහිතකර ලෙස බලපා තිබුණි. | පවතින පුරප්පාඩු සඳහා නිලධාරීන් බඳවා ගැනීමට කටයුතු කලයුතු වේ. | බඳවා ගැනීම සඳහා අනුමැතිය ඉල්ලා යවා ඇත. |

4.7.2 පාසල් කාර්යය මණ්ඩලය

------------------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම. |
|---|---|---|
| (අ) ගලෙන්බිඳුණුවැව කලාප අධ්‍යාපන කාර්යාලයේ අනුමත කාර්ය මණ්ඩලයේ තනතුරු 03 ක පුරප්පාඩු 14 ක් සහ තනතුරු 02 ක අතිරික්තතා 06 ක් පැවතුණි. | පුරප්පාඩු සඳහා සේවකයින් බඳවා ගැනීමට සහ අතිරික්ත සේවකයින් වෙනත් ස්ථානවලට මාරුකර යැවීමට කටයුතු කලයුතු වේ. | අදහස් දක්වා නැත. |
| (ආ) ගලෙන්බිඳුණුවැව අධ්‍යාපන කලාපයේ පාසල්වල තනතුරු 05 ක අතිරික්තතා 91 ක් සහ තනතුරු 04 ක පුරප්පාඩු 131 ක් පවතුණි. | පුරප්පාඩු සඳහා සේවකයින් බඳවා ගැනීමට සහ අතිරික්ත සේවකයින් වෙනත් ස්ථානවලට මාරුකර යැවීමට කටයුතු කලයුතු වේ. | අදහස් දක්වා නැත. |

4.7.3 රෝහල් කාර්යය මණ්ඩලය

-----------------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම. |
|---|---|---|
| විශේෂඥ වෛද්‍ය නිලධාරීන්, අනෙකුත් වෛද්‍ය නිලධාරීන්, පරිපූරක වෛද්‍ය සේවයේ නිලධාරීන්, හෙද නිලධාරීන් ඇතුළු උතුරු මැද පළාතේ රෝහල්වල පුරප්පාඩු 1111 ක් පැවතුණි. | පුරප්පාඩු සඳහා අවශ්‍ය කාර්යය මණ්ඩලය මධ්‍යම රජයෙන් ඉල්ලුම් කර ලබාගත යුතු වේ. | අදහස් දක්වා නැත. |

05. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය

-----------------------------------------

5.1 ක්‍රියාකාරී සැලැස්ම

----------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම. |
|---|---|---|
| 2014 පෙබරවාරි 17 දිනැති අංක 01/2014 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව පළාත් සභාව සහ එහි අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු සහ ආයතන 05 ක් විසින් සමාලෝචිත වර්ෂය වෙනුවෙන් ක්‍රියාකාරී සැලසුම් පිළියෙල කර නොතිබුණි. | චක්‍රලේඛය ප්‍රකාරව සියළුම ආයතන විසින් ක්‍රියාකාරී සැලසුම් පිළියෙල කල යුතුවේ. | අදහස් දක්වා නැත. |

5.2 වාර්ෂික වාර්තා සභාගත කිරීම

----------------------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම. |
|---|---|---|
| ඉකුත් වර්ෂවලට අදාල වාර්ෂික වාර්තා පාර්ලිමේන්තුවේ සභාගතකර නොතිබුණි. | වාර්ෂික වාර්තා පාර්ලිමේන්තුවේ සභාගතකල යුතුවේ. | අදහස් දක්වා නැත. |

5.3 තිරසර සංවර්ධන අරමුණු

-----------------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම. |
| --- | --- | --- |
| උතුරු මැද පළාත් සභාව සහ පළාත් සභාවේ අනෙකුත් ආයතන විසින් තිරසර සංවර්ධන අරමුණු ලඟාකර ගැනීම පිණිස එම අරමුණු කරා ගමන් කිරීමේදී සපුරාගත යුතු ඉලක්කයන් හා එම ඉලක්කයන් සපුරා ගැනීම සඳහා පවතින පරතරයන් මෙන්ම ප්‍රගතිය මැන බැලීම සඳහා සුදුසු දර්ශකයන් හඳුනා ගෙන නොතිබුණි. | තිරසර සංවර්ධන අරමුණු ලඟාකර ගැනීම පිණිස සපුරාගත යුතු ඉලක්කයන් හා එම ඉලක්කයන් සපුරා ගැනීම සඳහා පවතින පරතරයන් මෙන්ම ප්‍රගතිය මැන බැලීම සඳහා සුදුසු දර්ශකයන් හඳුනා ගතයුතුවේ. | අදහස් දක්වා නැත. |